**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

# 4 වන මොඩියුලය - ගූගල් (Google)


# Bitesize Training

## ඒ කුමක්ද?


**ෆෝන්-එකෙන් Google Search පෙන්වන්න.**

"ඔබට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට Google Search ඔබට උපකාරී වේ. ඔබට අවශ්‍ය තොරතුරු මොනවාදැයි ඔබ ඊට දැනුම්දිය යුතුය. උදා.: 'ලෝක ජනගහණය කීයද'('What is the population of the world') ලෙස දැනුම්දුන් විට, විවිධ පුද්ගලයන් විසින් ඉන්ටනෙට් වෙත මුදාහැර ඇති ඊට අදාළ සියලුම තොරතුරු ඇසුරෙන් ඔබට අවශ්‍ය තොරතුරු ඇතුළත් ප්‍රතිඵල ලැයිස්තුවක් පෙන්නුම් කෙරේ."

## ඔබට ඕනෑවෙන්නේ මේවාය



ස්මාර්ට්ෆෝන්-එක




Google පෝස්ටර්

## එය යොදාගත හැක්කේ කුමක් සඳහාද?

"ඔබට රැකියා අවස්ථා, කෑම වට්ටෝරු, චිත්‍රපට, සින්දු, ප්‍රවෘත්ති හෝ පාසලට/ විශ්වවිද්‍යාලයට අවශ්‍ය තොරතුරු ආදී සියල්ල එමගින් සොයාගත හැකිය."


"තොරතුරු සොයා ගැනීමට, ඔබ වෙනදා මෙන් තැනින් තැනට යායුතු නොවන අතර, ඔබේ අතේ ඇති ෆෝන්-එකෙන් ඔබට ඉන්ටනෙට් වෙත පිවිසී එම තොරතුරු ලබාගත හැකිය."

**පැහැදිලි කරන්න**: පුහුණුකරන්නා විසින් Google මගින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ සිය පෞද්ගලික උදාහරණ මෙන්ම, එය භාවිතා කරන්නේ කුමන කටයුතු සඳහා ද යන්න පැහැදිලි කරදෙන්න.

පුහුණුවෙන්නාට **එය අදාළ කරන්න**: පුහුණුවෙන්නාගේම ජීවිතයේ කටයුතුවලදී Google Search ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

## එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

### ෆෝන්-එක පුහුණුවන්නා අතට දී, මෙම පියවරවලට යාමට උදව් කරන්න




පෝස්ටරය පෙන්වා, සරල සෙවීමක් කරන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරදෙන්න.
**උදා.**: ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ ස්ථානයක් හෝ ප්‍රසිද්ධ පුද්ගලයෙකු ගැන තොරතුරු සොයාගන්නා ආකාරය පෙන්වාදෙන්න.

**පැහැදිලි කරන්න**: හඬ මගින් සෙවීමට (voice searches) මයික්‍රොෆෝනය භාවිතාකරන ආකාරය ද කියාදෙන්න. එවිට, කිසිම වචනයක් ටයිප් කිරීමට අවශ්‍ය නොවේ."

මයික්‍රොෆෝනය ඇති තැන පෙන්වා, එය භාවිතාකරන අන්දම කියාදෙන්න.

## පුහුණුවෙන්න!

"**Google** භාවිතා කරන ආකාරය දැන් ඔබ දන්නවා, එය මොනවා සඳහා යොදාගන්න ද ඔබ කැමති?"

පුහුණුවෙන්නාට ඔහු/ඇයගේ කැමැත්ත පරිදි, සෙවීමට ප්‍රධාන වචන (keywords) ලබාදෙන්න.


(එය සරලව තබාගැනීමට වචන 1-2ක් පමණක් ඇති ඒවා ලබාදෙන්න.)

**ඉඟිය** : "ඉන්ටනෙට් හි ඉතා වටිනා තොරතුරු ඇති අතරම, සමහර විට එතරම් වටිනාකමක් නැති තොරතුරු ද ඇත. ඊට අමතරව සත්‍ය නොවන තොරතුරු ද ඇති නිසා, ඔබ සොයන තොරතුරු පිළිබඳ ප්‍රතිඵල - අවම වශයෙන් මූලාශ්‍ර 2-3කින්වත් සනාථ කරගැනීම නුවණට හුරුය. "

**පැහැදිලි කරන්න** : Googleවලට අමතරව, තොරතුරු සෙවීම සඳහා - ඒ හා සමාන තවත් සේවා ඇති බව කියාදෙන්න. යාහූ (Yahoo) සහ බින් (Bing) යනු එවැනි සේවා සඳහා උදාහරණ වේ.

# පෝස්ටර්,
# කටවුට් සහ
# තොරතුරු පත්‍රිකා







Icon Cutouts - Google





# Google


1
2
3
4
5
සොයන්න, නැත්නම් "OkGoogle" කියන්න
Salman Khan - Wikipedia, the free encyclopaedia



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී